www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

NALANDA VIDYALAYA

දෙවන වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 10 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | ඒකකය 02 :ව්‍යාපාර පරිසරය |
|---|---|---|

- **පහත ප්‍රශ්ණ අංක 01 සිට 10 දක්වා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරන්න.**

01) ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයට බලපාන ව්‍යාපාරය තුළ ක්‍රියාත්මක වන විවිධ පාර්ශ්ව සහ සාධක ව්‍යාපාරයක ................................. පරිසරය ලෙස හැඳින්වේ.

1) ආර්ථික 2) අභ්‍යන්තර 3) බාහිර 4) ගෝලීය

02) බාහිර පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,

1) අයිතිකරුවෝ, සේවකයෝ, තරගකරුවෝ
2) ණයදෙනුකරුවෝ, තරගකරුවෝ, සැපයුම්කරුවෝ
3) සේවකයෝ, තරගකරුවෝ, ණයදෙනුකරුවෝ
4) කළමණාකරුවෝ, ණයදෙනුකරුවෝ, සේවකයෝ

03) ආර්ථික පරිසරයට අයත් විචල්‍යයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1) උද්ධමනය, නැනෝ තාක්‍ෂණය, ආයෝජන, බදු ප්‍රතිශත වෙනස්වීම්
2) පොළී අනුපාතය, ආදායම් ව්‍යාප්තිය, රැකියා නියුක්තිය, විද්‍යුත් තැපැල
3) රැකියා නියුක්තිය, ඉතිරි කිරීම්, ආදායම් ව්‍යාප්තිය, විනිමය අනුපාත
4) ආයෝජන, බදු ප්‍රතිශත වෙනස්වීම්, නව තාක්‍ෂණය, උද්ධමනය

04) 2019 වර්ෂයේ පත් වූ නව රජය විසින් 15%ක් ව පැවති එකතු කළ අගය මත බදු (VAT) ප්‍රතිශතය 2019 දෙසැම්බර් 01 දින සිට 8% දක්වා අඩු කරන ලදී. මෙමගින් ව්‍යාපාරයක ඇති වන බලපෑම අයත් වන්නේ ,

1) ගෝලීය පරිසරයටය 2) තාක්‍ෂණික පරිසරයටය
3) ආර්ථික පරිසරයටය 4) නෛතික පරිසරයටය

05) වර්තමානයේ පාරිභෝගිකයන් විදේශ වෙළෙඳපොලේ පවතින නිෂ්පාදන අන්තර්ජාලය හරහා මිලදී ගනු ලබයි. මෙම තත්ත්වය කෙරෙහි බලපෑ පරිසර සාධකය අයත් වනුයේ,

1) ආර්ථික පරිසරයයි 2) දේශපාලන පරිසරයයි
3) ගෝලීය පරිසරයයි 4) අභ්‍යන්තර පරිසරයයි

06) ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත හැකි තර්ජනයක් හා අවස්ථාවක් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,

1) ස්වභාවික ආපදා හා නව නගර නිර්මාණය
2) සේවකයන්ගේ අයහපත් ආකල්ප සහ කළමණාකරුවන්ගේ අත්දැකීම්
3) වෙළෙඳ සම්බාධක පැනවීම සහ පිළිගත් සන්නාම නාමයක් පැවතීම
4) ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් නොතිබීම සහ බදු සහන ලබාදීම

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

Agaram.LK - Keep your dreams alive!

07) ''අ'' තීරුවේ පරිසර බලවේගයන් කිහිපයක් ද, ''ආ'' තීරුවේ ව්‍යාපාර පරිසර කිහිපයක් ද දැක්වේ.

| ''අ'' | ''ආ'' |
|---|---|
| 1) නව යන්ත්‍ර සූත්‍ර නිර්මාණය<br>2) පොලී අනුපාත වෙනස්වීම්<br>3) නව රජයේ ප්‍රතිපත්ති මත කුඩා පාරිමාණ ව්‍යාපාරිකයන්ගේ ණය අයකිරීම අත්හිටුවීම.<br>4) ගුණාත්වයෙන් ඉහළ නව නිෂ්පාදන විදේශීය වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම. | A – දේශපාලන පරිසරය<br>B – ගෝලීය පරිසරයයි<br>C – තාක්ෂණික පරිසරය<br>D – ආර්ථික පරිසරය |

ඉහත ''අ'' සහ ''ආ'' තීරු පිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ,

i) C, D, A සහ B වේ. ii) B, C, A සහ D වේ.

iii) B, A, D සහ C වේ. iv) C, A, D සහ E වේ.

08) ව්‍යාපාරයකට නව තාක්ෂණ ක්‍රම සඳහා අනුගතවීම දුෂ්කර වීම ව්‍යාපාරයට,

1) ශක්තියකි 2) දුර්වලතාවයකි 3) අවස්ථාවකි 4) තර්ජනයකි

09) දේශීය ව්‍යාපාරයක ශක්තීන් හා අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

A - පරිභෝගික ජීවන රටාව වෙනස්වීම

B - අධිවේගී මාර්ග ඉදිකිරීම

C - පුහුණු සේවකයන් සිටීම

D - රජය විසින් ආනයනි භාණ්ඩ මත බදු පැනවීම

E - පිළිගත් සන්නම් නාමයකන් තිබීම

agaram.lk

මෙහි සඳහන් අවස්ථා පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

i) A හා B පමණයි ii) A, C හා E පමණයි

iii) A, B හා D පමණයි iv) C, D හා E පමණයි

10) "X" සහ "Y" තීරු නිවැරදි ගැලපීම් තෝරන්න.

| X | Y |
|---|---|
| 1) පොලී අනුපාතය | A – රටක ආදායම් එරට ජනතාව අතර බෙදී ඇති ආකාරයයි. |
| 2) ඉතුරුම් | B – භාණ්ඩ හා සේවා අලෙවියේදී තීරණය වන පොදු මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම |
| 3) උද්ධමනය | C – බැංකු තැන්පතු සඳහා ලබාදෙන පොලී ප්‍රතිශතය සහ බැංකු ණය සඳහා අයකරනන පොල් ප්‍රතිශතය |
| 4) ආදායම් ව්‍යාප්තිය | D – පුද්ගලයන් තම ආදායමෙන් පරිභෝජනය සඳහා වැය නොකොට තබා ගන්නා කොටසයි |

"X" හා "Y" තීරු ගැලපූ විට නිවැරදි පිළිතුරු කාණ්ඩය වනුයේ,

1) C, B, D සහ A වේ. 2) C, A, D සහ B වේ.

3) D, A, C සහ D වේ. 4) C, D, B සහ A වේ.



agaram.lk

## II කොටස

- **ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.**

01) ව්‍යාපාර පරිසරය යනු කුමක්ද?

02) ව්‍යාපාර පරිසරය වර්ග කළ හැකි ප්‍රධාන කොටස් 02 නම් කර උදාහරණ 02 බැගින් දක්වන්න.

03) පහත දැක්වෙන ව්‍යාපාර පරිසර පාර්ශ්ව සහ බලවේග, අභ්‍යන්තර සහ බාහිර පරිසරය අනුව වර්ග කර දක්වන්න.

| | | |
|---|---|---|
| අයවැය ප්‍රතිපත්ති | අයිතිකරුවෝ | මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| සේවකයෝ | සැපයුම්කරුවෝ | කම්කරු නීති |
| කළමණාකරුවෝ | සන්නිවේදන තාක්‍ෂණයේ දියුණුව | |

| අභ්‍යන්තර පරිසරය | බාහිර පරිසරය |
|---|---|
| | |

- **පහත සිද්ධිය ඇසුරෙන් 04 සිට 07 දක්වා ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.**

නඳුන් ආටිගල තම පියාගේ යොමු කිරිම මත දෙමව්පියන් විසින් ලබාදුන් රු. 100,000/- මුදලක් යොදවමින් "අඹසෙවන" නමින් නැවුම් පළතුරු බීම සකස් කර විකිණීම සහ වස විසෙන් තොර නැවුම් පළතුරු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි.

තම ප්‍රදේශීය දේශීය පළතුරු බහුල වීමත්, අලෙවි සැල අනුරාධපුරයේ අටමස්ථාන පූජාබිම ඉතා සමීපව පැවතීමත්, නඳුන් විසින් ව්‍යවසායකත්ව අමාත්‍යාංශයේ ලබාගත් පුහුණුවීම් හා ආධාර නිසාත් කෙටි කාලයක් තුළ ව්‍යාපාරය සාර්ථකත්වයට පත්විය.

04) "අඹසෙවන" ව්‍යාපාරය සපයන මිනිස් අවශ්‍යතාවය සහ වුවමනාව පිළිවෙලින් ලියා දක්වන්න.

05) "අඹසෙවන" ව්‍යාපාරයේ බාහිර පරිසරයට අයත් සාධකයක් සිද්ධිය ඇසුරෙන් ලියා දක්වන්න.

06) ව්‍යාපාර අභ්‍යන්තර පරිසරය සහ බාහිර පරිසරය අතර වෙනස පැහැදිලි කරන්න.

07) අඹසෙවන ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තීන්, දුර්වලතා සහ අවස්ථා සඳහා උදාහරණ සිද්ධිය ඇසුරෙන් ලියා දක්වන්න.

- **පහත සඳහන් ප්‍රශ්ණ සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

08) තාක්‍ෂණික පරිසරය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

09) තාක්‍ෂණික පරිසරයේ පහත සඳහන් විචල්‍යයන්ගේ වෙනස්වීම ව්‍යාපාරයකට බලපෑම් සිදු කරන ආකාරය ලියා දක්වන්න.
   1) නව යන්ත්‍ර සූත්‍ර සොයාගැනීම
   2) ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුව
   3) සන්නිවේදන ක්ෂේත්‍රයේ දියුණුව
   4) නව තාක්‍ෂණය / නිෂ්පාදන ක්‍රම සොයා ගැනීම

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

10) ව්‍යාපාරික පරිසරය අධ්‍යයනයේදී ආර්ථික පරිසරය යනුවෙන් හැඳින්වෙනුයේ කුමක්ද?

- **පහත සිද්ධිය ඇසුරෙන් 11 සහ 12 ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.**

2020 වසරේ ලෝක ආර්ථිකයට දැඩි බලපෑමක් ඇති කළ ලෝකය පුරා ව්‍යාප්ත වී ඇති නව කොරෝනා වසංගතය (COVID 19) හේතුවෙන් ශ්‍රී ලංකාවේ ද රැකියා වියුක්තිය (රැකියා අහිමි පිරිස) ඉහල ගොස් ඇත.

11) ඉහත සිද්ධිය තුළින් දේශීය ව්‍යාපාරවලට බලපෑම් ඇති කරන ව්‍යාපාර පරිසරයන් 02 සඳහන් කරන්න.

12) ගෝලීය පරිසරයේ විවිධ සාධකවල වෙනස්වීම් දේශීය ව්‍යාපාර කෙරෙහි ඇති කරන හිතකර සහ අහිතකර බලපෑම් 03 බැගින් ලියන්න.

13) ශදුඅත විශ්ලේෂණය ව්‍යාපාරයකට වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.

14) විදේශ විනිමය අනුපාතය යනු කුමක්ද?

15) ව්‍යාපාරය කෙරෙහි රජයේ මැදිහත්වීම සඳහා පිහිටුවා ඇති ආයතන 02ක් නම් කරන්න.

සැකසුම :- බී.එස්. ඉමේෂා ලක්ෂ්මන්

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk